**ලංකා ධීවර සංස්ථාව - 2018**
**-------------------------------------**

ලංකා ධීවර සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
--------------------------------------------------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්වයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ,රීති මගින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තාද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඈ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය. එසේ වුවත්, 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ව්‍යවස්ථාපිත මණ්ඩල වල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු 2016, 2017 හා 2018 වර්ෂ වල මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**02. විගණන නිරීක්ෂණ**
-----------------------------------

**(අ) නීති ,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.**

| | නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i.) | 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 හි 5.1 ඡේදය | 2017 වර්ෂයේ සිට ඉදිරි කාලපරිච්ඡේද සඳහා වූ සංයුක්ත සැලැස්ම සහ 2018 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම විගණිත දිනය වූ 2019 සැප්තැම්බර් දක්වාම පිළියෙල කර නොතිබුණි. | කළමනාකාරීත්වය අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාර සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර සංස්ථාවේ අරමුණු හා ඉලක්ක ලඟාකර ගැනීමට කටයුතු කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ii.) | 2003 ජුනි 2 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 හි 9.4 ඡේදය | 2016 වර්ෂයේ සිට සංස්ථාවට අයත් නිලධාරීන් තිදෙනෙකු වෙනත් රාජ්‍ය ආයතන 2 ක් වෙත මුදාහැර එම නිලධාරීන් දෙදෙනා සඳහා රු. 2,638,104 ක්වූ වැටුප් හා වේතන ලෙස ගෙවා තිබුණි. | කළමනාකාරීත්වය අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

**(ආ) කළමනාකරණ ක්‍රියාකාරකම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ----------------------- | ------------- |
| (i) | 1964 ඔක්තෝබර් 01 දිනැති අංක 14/186 දරණ සහ 2011 ජුනි 30 දිනැති අංක 1712/21 දරණ අතිවිශේෂ ගැසට් පත්‍ර මගින් නියම කරන ලද ව්‍යාපාරික කාර්යයන් අතුරින් සෘජුවම හෝ ඒජන්තවරුන් මාර්ගයෙන් ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීමේ මෙහෙයුම් වල නිරතවීම, මත්ස්‍ය පිරිසැකසුම් වල නිරත වීම, බලයලත් ඒජන්තවරු මාර්ගයෙන් මසුන් තොග සහ සිල්ලර වෙළඳාම් කිරීම, මසුන් සහ මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සහ අපනයනය කිරීම සහ විදේශීය වෙළඳපොලවල මසුන් විකිණීම යන කාර්යයන් සංස්ථාව විසින් ඉටු කර නොතිබුණි. සංස්ථාව ස්ථාපිත කිරීමේදී සංස්ථාව වෙත පැවරී තිබූ ධීවර වරායන් සහ නැංගුරම් පොළවල් ඉදිකිරීම සහ පවත්වාගෙන යාම, ධීවර ආම්පන්න ආනයනය කිරීම සහ විකිණීම, ධීවර යාත්‍රා ඉදිකිරීම, ධීවර යාත්‍රා සඳහා නඩත්තු පහසුකම් සැපයීම, ධීවරයන්ගේ ඉල්ලීම් අනුව අවශ්‍ය උපකරණ නිපදවා අලෙවිකිරීම යන ව්‍යාපාරික කාර්යයන් ධීවර අමාත්‍යාංශය යටතේ ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, සීමාසහිත සී - නෝර් පදනම හා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය යන ආයතන ස්ථාපිත කිරීමත් සමඟ එම ආයතනවලට පැවරී තිබුනත්, ඒ අනුව සංස්ථාවේ ව්‍යාපාරික කර්තව්‍යයන් සංශෝධනය කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | කළමනාකාරීත්වය අදහස් දක්වා නොතිබුණි. | සංස්ථාව පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය පාලන ක්‍රම ශක්තිමත් කළ යුතු අතර ගැසට්පත්‍ර මගින් ව්‍යාපාරික කාර්යන් සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු බව. |
| (ii) | සංස්ථාව විසින් මසුන් අලෙවි කිරීමේදී නියෝජිතයන් මාර්ගයෙන් රටතුල සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි මසුන් අලෙවිකිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් මත්ස්‍ය වෙළඳපොළෙහි මිල ස්ථායිකරණය කිරීමේ නියාමන ආයතනයක් ලෙස කටයුතු කිරීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි. මේ නිසා පසුගිය වර්ෂ 06 ක කාලය තුළදී ලංකා ධීවර සංස්ථාවේ වෙළඳපොළ කොටස සියයට 1.1 සිට 0.7 දක්වා අඩු වී තිබුණි. | කළමනාකාරීත්වය අදහස් දක්වා නොතිබුණි. | රට තුළ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ධීවර මසුන් අලෙවි කිරීමටත් සංස්ථාවේ මාළු වෙළඳපල කොටස වැඩි කර ගැනීමට ප්‍රමාණවත් වැඩපිළිවෙලක් සකස් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (iii) | මසුන් අලෙවි කිරීමේදී ඒජන්තවරු මාර්ගයෙන් මසුන් අලෙවි කිරීම තුලින් පිරිවැය අඩුකර ගතහැකි වුවද සංස්ථාව විසින් පිරිවැය අධික ක්‍රමයක් වන නව වෙළඳසැල් ඉදිකර මසුන් විකිණීම කෙරෙහි වැඩි අවධානයක් යොමුකර තිබුණි. තවද, නව වෙළඳසැල් ඉදිකර වෙළඳසැල් සඳහා නව කාර්ය මණ්ඩල බඳවා ගැනීමට සිදුවීම හේතුවෙන් සංස්ථාවෙහි මෙහෙයුම් වියදම් තවදුරටත් ඉහල යන බව විගණනයේදී නිරීක්ෂණය විය. | කළමනාකාරිත්වය අදහස් දක්වා නොතිබුණි. | මෙහෙයුම් පිරිවැය අවම කර ගැනීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. |
| (iv) | සෘජුවම හෝ ඒජන්තවරු මාර්ගයෙන් ගැඹුරු මුහුදේ ට්‍රෝලර් යාත්‍රා යොදා ගෙන මසුන් ඇල්ලීම සංස්ථාව ස්ථාපිත කිරීමේ ව්‍යාපාරික කර්තව්‍යයක් වුවත් , ඒ අනුව එසේ කටයුතු නොකිරීමත් මසුන් සැපයුම්කරුවන්ට මුදල් ගෙවීම ප්‍රමාද වීමත් හේතුවෙන් අඩුමිලට මසුන් මිලදී ගෙන සාධාරණ මිළකට පාරිභෝගිකයන්ට මසුන් ලබාදීමේ අරමුණු ගත කාර්යය ඉටු කළ නොහැකිව තිබුණි. | කළමනාකාරිත්වය අදහස් දක්වා නොතිබුණි. | සංස්ථාව පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය කටයුතු කල යුතු බව. |
| (v) | සංස්ථාව ප්‍රතිව්‍යුහගත කර ලාභදායී වාණිජමය ව්‍යාපාරයක් බවට පත්කිරීමේ අරමුණින් අමාත්‍ය මණ්ඩල තීරණයන් මත ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර 2016 මාර්තු 18 දිනැති 02/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය පරිදි 2016 මැයි 20 දින රු.109,906,261 ක් වැය කර සේවකයන් 102 දෙනෙකු විශ්‍රාම ගන්වා තිබුණි. සංස්ථාව ලාභදායී වාණිජ ව්‍යාපාරයක් බවට පත්කිරීමේ අරමුණට ළඟාවීම සඳහා අවශ්‍ය අනිකුත් සැලසුම් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. | කළමනාකාරිත්වය අදහස් දක්වා නොතිබුණි. | කළමනාකරණය විසින් සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා සැලසුම් සකස් කළ යුතු අතර චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කල යුතු බව. |
| (vi) | 2011 වර්ෂයේ සිදුවී තිබූ රු.2,558,028 ක් වටිනා ඇසුරුම් තොග ඌනතාවය අයකරගෙන නොතිබීම. | කළමනාකාරිත්වය අදහස් දක්වා නොතිබුණි. | තොග ඌණතාවයන් පිළිබඳ පරීක්ෂාවී ඒ සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (vii) | සංස්ථාව සතුව අධිශීතකරණ සහිත ලොරි රථ 50 ක් පැවති අතර ඉන් ලොරි රථ 46 කම ශීතකරණ පද්ධතිය ක්‍රියාවිරහිතව තිබියදී මසුන් අලෙවිය සඳහා යොදවා ගෙන තිබීම. | කළමනාකාරිත්වය අදහස් දක්වා නොතිබුණි. | සංස්ථාවේ සම්පත් කාර්යක්ෂම මෙහෙයුම් කටයුතු සඳහා යොදවා ගත යුතු බව. |

**(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| | ------------------------ | -------------------------------- | ------------- |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.213,398,533 ක් වූ අයවිය යුතු හිඟ ණය ශේෂය තුල වූ වර්ෂ 2 ට වැඩි රු.21,350,932 ක්ද, වර්ෂ 5 ට වැඩි රු. 53,856,139 ක්ද, වසර 10 ට වැඩි රු.13,931,795 ක්ද, විශ්ලේෂණය කළ නොහැකි ශේෂය රු.884,913 ක්ද ඇතුලත් වී තිබුණි. | කළමනාකාරිත්වය අදහස් දක්වා නොතිබුණි. | ණයගැතියන්ගෙන් ලැබිය යුතු මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ii) | 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු.111,008,896 ක් වූ රෝහල් 07 ක ණයගැති ශේෂ නොමැති බව එම රෝහල් 07 දන්වා තිබුණත් ඒ පිළිබඳ පරීක්ෂා වී නොතිබුණු අතර අභ්‍යන්තර විගණන අංශය විසින් කරන ලද ශේෂ සනාථන වලදීද රු.21,586,769 ක් වූ ණයගැතියන්ට අදාලව ශේෂ සනාථන ලැබී නොතිබුණි. | කළමනාකාරිත්වය අදහස් දක්වා නොතිබුණි. | ණයගැති ලේඛන වල දක්වා ඇති ශේෂවල නිවරදිතාවය සනාථ කර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.210,105,942 ක් වූ හිඟහිටි ණයහිමි ශේෂයෙන් රු.41,186,374 ක් වසර 02 ට වැඩි කාලයක සිට පැවතීමත්, රු.21,006,310 ක් වූ ණයහිමි ශේෂ සඳහා කාල විශ්ලේෂණ නොතිබුණි. | කළමනාකාරිත්වය අදහස් දක්වා නොතිබුණි. | ණයහිමියන්ට කඩිනමින් මුදල් ගෙවීමට හෝ තවදුරටත් වගකීමක් නොමැති ණයහිමි ශේෂ වේ නම් ශේෂ පොත්වලින් කපාහැරීමටත් කටයුතු කිරීම. |

**(ඈ) හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | -------------------------- | ------------ |
| සංස්ථාව විසින් 2006 ජනවාරි සිට 2019 ජුලි 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට රු.174,927,250 ක හිඟ දායක මුදලක් සහ රු.82,367,893 අධිභාර මුදලක්ද, 2006 සිට 2016 කාලපරිච්ඡේදය වෙනුවෙන් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට රු. 15,520,274 ක හිඟ දායක මුදලක් සහ රු. 7,663,632 ක අධිභාර මුදලක් සහ 2018 දෙසැම්බර් 31 දිනට රු.8,300,133 ක හිඟ පාරිතෝෂිත මුදලක් සහ ඒ වෙනුවෙන් රු.1,116,950 ක අධිභාර මුදලක් ගෙවිය යුතුව තිබුණි. | කළමනාකාරිත්වය අදහස් දක්වා නොතිබුණි. | **ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත දිනට ගෙවීම් කිරීමට අවශ්‍ය පාලන ක්‍රම සකස් කර, ඒ පිළිබඳ අධීක්ෂණය කිරීම කළ යුතු බව.** |

**(ඉ) මෙහෙයුම් ක්‍රියාකාරකම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | පාදුක්ක වටරවුම් පාරේ පිහිටි අලෙවිසැල 1994 වර්ෂයේ සිට ගිවිසුමකින් තොරව පවත්වා ගෙන යන බව විගණනයට නිරීක්ෂණය විය. තවද 2018 අගෝස්තු 22 දිනැති 1041 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අනුමැතිය ප්‍රකාරව නව කුලියක් යටතේ නැවත බදු ගිවිසුමකට එළඹීමට උපදෙස් ලබා දී තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | නීති අංශය විසින් පවත්වාගෙන යන ගිවිසුම් පිටපත් සහිත ලිපිගොනුව අස්ථානගත වී ඇති අතර මෙහෙයුම් අංශයේ ලිපිගොනුව 2019 සැප්තැම්බර් 05 දින අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසන් සභාව වෙත භාර දී ඇත. | වගකිව යුතු නිලධාරීන් යටතේ ලිපිගොනු පවත්වාගෙන යා යුතු අතර එවා අස්ථානගත වීමට හේතු පරීක්ෂා කළ යුතු බව. |
| (ii) | 2018 වර්ෂයට පෙර අපහරණය කිරීමට තීරණය කළ මුළු වටිනාකම රු. 3,200,000 ක් වූ වාහන 04 ක් සහ වටිනාකම හඳුනාගෙන නැති වාහන 04 ක් අපහරණය නොකිරීමෙන් 2019 දෙසැම්බර් 20 වන විටත් ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත් වෙමින් තිබුණි. | කළමනාකරණය විසින් අදහස් දක්වා නොතිබුණි. | වාහන අපහරණය කිරීමේ චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු බව. |
| (iii) | 2017 පෙබරවාරි 27 දින රු.1,500,000 ක් වූ පරිගණකගත ගිණුම් කළමනාකරණ පද්ධතියක් මිලදී ගැනීම සඳහා පෞද්ගලික සමාගමකට 2017 අගොස්තු 31 දින කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. එසේ වුවත් මේ සඳහා ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 5.2.1, 5.3.11 ,5.4.4 ප්‍රකාර කොන්ත්‍රාත් ගිවිසුමක්, ලංසු සුරක්ෂණයක් සහ රු. 300,000 ක අත්තිකාරම් ගෙවීම සඳහා බැදුම්කරයක්ද ලබා ගෙන නොතිබුණි. 2019 සැප්තැම්බර් 25 දින වන විට අවුරුදු 02 ක් ගතවී තිබුණද පරිගණකගත ගිණුම් කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි. | කළමනාකරණය විසින් අදහස් දක්වා නොතිබුණි. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ දැක්වෙන උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම සම්බන්ධව අදාළ ආයතනයෙන් වන්දි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iv) | රජයේ තක්සේරු කරු විසින් මාසික බදුකුලිය රු.141,667 ක් ලෙස තක්සේරු කළ ජේසාලේ පිහිටි සංස්ථාවට අයත් අක්කර 03 රූඩ් 01 පර්චස් 13.9 ක් වූ ව්‍යාපාරික ස්ථානය 2016 ඔක්තෝබර් 17 දින ප්‍රසම්පාදන කමිටුව විසින් මාසික කුලිය රු.150,000 ක් ලෙස තීරණය කර තිබුණි. එම තීරණයට අනුකූල නොවී මාසික බදුකුලිය රු.130,000 කට බදු දීම නිසා 2016 දෙසැම්බර් 14 දින සිට සංස්ථාවට රු.480,000 ක අලාභයක් සිදු වී තිබුණි. | 2016 දෙසැම්බර් 05 වන දිනැති හැන්ඩ් සී ෆුඩ් එක්ස්පෝර්ට් (පුද්) සමාගම විසින් ජේසාලේ ඉඩම රු.130,000 ක මාසික බදු මුදලකට බදු පදනමින් ලබා දීම සඳහා කරන ලද ඉල්ලීමකට සාමාන්‍යාධිකාරී නිර්දේශ කර, සභාපතිතුමා විසින් අදාල ඉදිරි කටයුතු සිදු කරන ලෙසට 2016 දෙසැම්බර් 09 වන දින නීති අංශය වෙත උපදෙස් ලබා දී තිබුණි. | ප්‍රසම්පාදන කමිටු තීරණය අධ්‍යක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු බවත්, සංස්ථාව සතු ඉඩම් ආරක්ෂා කර ගැනීමට ප්‍රමාණවත් පාලන ක්‍රම හඳුන්වාදී ක්‍රියාත්මක කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | 2016 දෙසැම්බර් 14 දින ඇතිකරගත් කල්බදු ගිවිසුමේ 06 වන වගන්තිය අනුව ගිවිසුම ආරම්භයේදී වර්ෂයක කාලසීමාවක් සඳහා රු.500,000 ක බැංකු ඇපකරයක් සංස්ථාවට ලබාදී එය වාර්ෂිකව යාවත්කාලීන කරගත යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.<br><br>සංස්ථාවට අයිතිව තිබූ අක්කර 20 යි රූඩ් 01 පර්චස් 15 ක් වූ මුළු ඉඩමෙන් බදු දුන් ඉඩම වෙන් නොකිරීම හේතුවෙන් මුළු ඉඩම් ප්‍රමාණයම පෞද්ගලික සමාගමට පරිහරණය සඳහා අවස්ථාව සලසා තිබුණි. | | |
| (v) | ගාල්ල අයිස් යන්ත්‍රාගාරයේ ශීතාගාරයට අයත් කන්ඩෙන්සර් දෙක රු.313,103 කට පැරණි යකඩ වලට 2018 මැයි 16 දින විකුණා තිබුණි. මුදල් රෙගුලාසි 770 හා 771 අනුව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් මගින් පාවිච්චි කළ නොහැකි භාණ්ඩ ලෙස හඳුනාගෙන නොතිබුණි. තවද තාක්ෂණික දැනුමැති ඉංජිනේරුවරයෙකුගේ වාර්තාවක් සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියද ලබාගෙන නොතිබුණි.<br><br>තවද ගාල්ල අයිස් යන්ත්‍රාගාරයට කන්ඩෙන්සර් යන්ත්‍රයක් රු.6,368,750 බැගින් යන්ත්‍ර 2 ක් රු.12,737,500 කට (වැට් රහිතව) මිලදී ගැනීමට ප්‍රසම්පාදන මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. මේ සඳහා රු.2,547,500 ක අත්තිකාරම් 2018 අප්‍රේල් 12 දින ගෙවා කන්ඩෙන්සර් දෙක පද්ධතියට සම්බන්ධ කර තිබුණද, අයිස් මිදීමට ගතවන කාලය වැඩිවීම, කන්ඩෙන්සරයේ ගෑස් හා ජලය කාන්දුවීමක් පැවතීම, හා ගුණාත්මක තත්ත්වයෙන් අඩු කන්ඩෙන්සරයක් සවිකර තිබුණි.<br><br>තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අනුව ඉල්ලුම්කරන ලද කන්ඩෙන්සර් යන්ත්‍ර 02 පිරිවිතරයන්ට අනුකූල නොවන්නේ නම් කිසිදු කොන්දේසියකින් තොරව ප්‍රතික්ෂේප කර අත්තිකාරම් මුදල ආපසු ලබාගන්නා ලද බව දක්වා තිබුණද 2019 දෙසැම්බර් වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | විගණන විමසුමේ කරුණු සම්බන්ධයෙන් එකඟ වේ. ඉනොවේව් ඉංජිනියරින් පුද්ගලික සමාගමෙන් මිලදී ගත් කන්ඩෙන්සර් යන්ත්‍ර දෙක සඳහා රු.12,737,500 (වැට් රහිත) මුදලින් 20% මුදල වන රු.2,547,500 ක මුදලක් සංස්ථාවෙන් ගෙවා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් මත විශේෂඥ දැනුම ඇති ඉංජිනේරුවකුගේ වාර්තාවක් ලබා ගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබන බව දන්වා සිටිමි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු බවත්, රජයේ ප්‍රතිපාදනවලින් උපරිම ඵලදාවක් ලැබෙන සේ එම ප්‍රතිපාදන වැය කිරීමටත් කටයුතු කළ යුතු අතර ගිවිසුම් ප්‍රකාරව වගකිව යුතු පාර්ශවවලින් අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (vi) | සංස්ථාව විසින් 2017 මාර්තු 28 දින මෝදර ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩමෙන් පර්චස් 117.78 ක් සහ පර්චස් 30 ක භූමි ප්‍රමාණයක් වසර 4 ක කාලයක් සඳහා පෞද්ගලික ආයතනයකට පිළිවෙලින් මාසික බදු කුලිය රු.1,100,000 කට සහ රු.333,000 කට බදු දී තිබූ අතර 2019 අගෝස්තු 16 දින දක්වා මාස 08 ක හිඟ බදු කුලිය වූ රු.5,487,450 ක් අයකරගෙන නොතිබුණි. පෞද්ගලික ආයතනය විසින් තවත් පර්චස් 49.7 ක් අනවසරයෙන් භාවිතා කර තිබුණද ඉන් පර්චස් 29.7 ක රජයේ තක්සේරුකරුගේ මාසික බදු තක්සේරුව රු.178,333 ක් විය. ඒ අනුව පර්චස් 29.7 ක් අනවසරයෙන් භාවිතා කිරීම හේතුවෙන් 2017 මාර්තු සිට 2019 අගෝස්තු දක්වා සංස්ථාවට අහිමි වූ බදු කුලිය රු.4,993,334 ක් විය. | විගණන විමසුමේ කරුණු අනුව එකඟ වේ. විගණන විමසුමේ සඳහන් පරිදි වෝකර්ස් කලම්බු ෂිප්යාර්ඩ් පුද්ගලික සමාගම 2016/86 B පිඹුරෙහි ඇති ලොට් අංක A කොටසට අයත් පර්චස් 29.7 ප්‍රමාණය හා ආසන්න වශයෙන් පවතින පර්චස් 20 භූමියක ප්‍රමාණයද එම ආයතනය වෙත බදු දීම හෝ එම ප්‍රදේශය නැවත සංස්ථාවට භාරගැනීමට එම සමාගම සමඟ 2019 ඔක්තෝබර් 23 දින මූලික සාකච්ඡාවක් සිදුකර ඇත. | හිඟ බදු කුලී අයකර ගැනීමට කටයුතු කල යුතු අතර සංස්ථාව සතු ඉඩම් ආර්ථිකමය වටිනාකම මත බදු දීමට කටයුතු කළ යුතුය. |
| (vii) | උත්සව සමයේ සහන මිලට මසුන් අලෙවි කිරීම සඳහා රුපියල් මිලියන 100 ක් ධීවර සංස්ථාවට ලබා දී තිබුණි. ඉන් මිලියන 15.7 ක් සැපයුම්කරුවන්ගේ හිඟ ශේෂ පියවීම සඳහාත් , රු. මිලියන 45 ක් බැංකු අයිරා පියවීම සඳහාත් තවත් රු. මිලියන 10.7 ක් පාරිතෝෂිත ගෙවීම සඳහාත් යොදාගෙන තිබුණි. | කළමනාකරණය විසින් විගණන ඡේදය පිළිගෙන ඇත. | සංස්ථාවට ලබා දෙන ප්‍රතිපාදන අදාල අරමුණු සඳහා යොදවා ගැනීමට කළමනාකරණය කටයුතු කළ යුතු බව. |
| (viii) | කල් ඉකුත් වූ පරිභෝජනයට නුසුදුසු මසුන් විකිණීම සම්බන්ධයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් නඩු 03 ක්ද, සංස්ථාවේ වාහන අනතුරු සම්බන්ධයෙන් රු.9,500,000 ක වන්දි ඉල්ලා නඩු 05 ක්ද, සේවකයින් විසින් නැවත රැකියාව හා පසු වැටුප් වන්දි ඉල්ලා නඩු 07 ක්ද, සේවිකාවක් විසින් රු.මිලියන 5 ක වන්දි ඉල්ලා නඩුවක්ද මූලික අයිතිවාසිකම් කඩවීම් සම්බන්ධයෙන් සංස්ථාවේ සේවකයින් නඩු 02 ක්ද, සංස්ථාවට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණ, දිසා අධිකරණ හා ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා තිබුණි. | කළමනාකරණය විසින් අදහස් දක්වා නොතිබුණි. | ආයතනයට එරෙහිව ඇති නඩු සම්බන්ධයෙන් අවධානය යොමුකර කඩිනමින් අවසන් කර ගැනීමටත්, එවැනි සිදුවීම් ඇති නොවීමට අවශ්‍ය පාලන ක්‍රම හඳුන්වාදී ක්‍රියා කිරීමටත් කටයුතු කළ යුතු බව. |
| (ix) | 2018 දෙසැම්බර් 31 දිනට ලංකා ධීවර සංස්ථාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව මසුන් ණයට විකුණා ලැබිය යුතු රු.23,481,680 ක් අයකර ගැනීම සඳහා නඩු 09 ක්ද, බදුකුලී රු.19,438,275 ක් අයකර ගැනීම සඳහා නඩු 06 ක්ද පවරා තිබුණි. | කළමනාකරණය විසින් අදහස් දක්වා නොතිබුණි. | සංස්ථාවට ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (x) | 2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 7.4.2 වගන්තිය අනුව වාර්ෂික කාර්යසාධනය ඇගයීම් කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කල යුතු වුවද, සංස්ථාවෙහි වාර්ෂික කාර්යසාධනය ඇගයීම් කිරීම සඳහා එවැනි ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුවක් පත් නොකිරීම හේතුවෙන් පහත සඳහන් අඩුපාඩු සම්බන්ධයෙන් විධිමත් ඉදිරි පියවරයක් ගෙන නොතිබුණි.<br><br>• සංස්ථාවෙහි කාර්ය සාධනය ඇගයීම් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමුවී නොතිබූ අතර මසුන් අලෙවිය සිදුකරන විධායක 32 අතරින් 2014 වර්ෂයේ විධායකයන් 28 ක්ද, 2015 වර්ෂයේ විධායකයන් 30 ක්ද, අලාභ ලබා තිබුණු අතර, පිළිවෙලින් එම වර්ෂ වල ලබා ඇති මුළු අලාභය රු.180,538,573 ක් සහ රු.138,040,828 ක් විය. අයිස් යන්ත්‍රාගාර 08 ම 2015 වර්ෂයේ රු.33,364,965 ක අලාභ ලබා තිබූ අතර සංස්ථාව විසින් අලාභ අවමකර ගැනීමට සැලසුම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සකස් කර නොතිබුණි.<br><br>• ඉකුත් වර්ෂයේ විගණන විමසුම් 06 ක් හා සමාලෝචිත වර්ෂයේ විමසුම් 09 ක් සඳහාත් පිළිතුරු සපයා නොතිබුණි.<br><br>• අභ්‍යන්තර විගණන වාර්තා පරීක්ෂා කිරීමේදී බේරුවල විධායකයේ 2016 ජනවාරි 01 සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා රු.1,877,993 ක් වූ ණයගැති ශේෂය තුල රු.1,550,464 ක් වූ අක්‍රීය ණයගැති ශේෂ පැවති අතර වගකිවයුතු නිළධාරීන්ගෙන් එකී ණයශේෂ අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොතිබුණි. | සංස්ථාව විසින් අලාභ අඩුකර ලාභ වැඩිකර ගැනීමටත්, විගණන විමසුම සඳහා පිළිතුරු ලබා දීමටත්, සංස්ථාවට ලැබිය යුතු ණය අයකර ගැනීමත්, සංස්ථාව සතු වත්කම් ආරක්‍ෂා කර ගැනීම සඳහාත් විධිමත් පාලන ක්‍රම ක්‍රියාත්මක කල යුතු බව. |

(ඊ) කාර්ය මණ්ඩල කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ---------------------------------- | ----------- |
| (i) | 2018 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යමණ්ඩලය තනතුරු 724 ක් වූ අතර සත්‍ය කාර්යමණ්ඩලය 571 ක් විය. පුරප්පාඩු 153 ක් පැවතුනි. අනුමත කාර්ය මණ්ඩලය අනුව සංස්ථාවේ දෛනික ව්‍යාපාරික කටයුතු සිදුකිරීමට අත්‍යවශ්‍ය ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වන සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මානව සම්පත් සංවර්ධන හා පරිපාලන, ගණකාධිකාරී, පිරිවැය සහ කළමනාකරණ ගණකාධිකාරී ඇතුළුව තනතුරු 19 ක් පුරප්පාඩු පැවතීම හේතුවෙන් සංස්ථාවේ පරිපාලන කටයුතු සහ කාර්යසාධනය කෙරෙහි අහිතකර ලෙස බලපෑම් සිදු වී තිබුණි.<br><br>තවද අනුමත කාර්ය මණ්ඩල තනතුරු අතරින් අතිරික්ත සේවක සංඛ්‍යාව 107 ක් වීම හේතුවෙන් සංස්ථාව මූල්‍ය අර්බුදයකට මුහුණ පා සිටින බවත් ස්වේච්ඡා වන්දි ක්‍රමය යටතේ මිලියන 115 ක් වැයකර විශ්‍රාම ගැන්වීමෙන් සංස්ථාව බලාපොරොත්තු වූ අරමුණු ඉටු වී නොමැති බවත් නිරීක්ෂණය විය. | කළමනාකරණය අදහස් දක්වා නොතිබුණි. | පරිපාලන කටයුතු ශක්තිමත් කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ මට්ටමේ අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු බව. |
| (ii) | ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 13.3 වගන්තිය අනුව වැඩ බැලීමේ පත්වීමක් කළයුත්තේ පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් වුවත් තනතුරු 15 ක් සඳහා වසර 1 සිට 20 දක්වා කාලයක් වැඩ බැලීම් සිදුකර තිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොතිබුණි | ආයතන සංග්‍රහයේ හා චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු බව. |